# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

11 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

නම/ විභාග අංකයඃ ..........................................  කාලය පැය 2 යි

<u>සැලකිය යුතුයි.</u>

- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව ලකුණු 80කි.**

01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. (අ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමේ අරමුණ කුමක්ද?
(ආ) ගුත්තිල කාව්‍ය රචනා කිරීම සඳහා මූලාශ්‍ර වූ ජාතක කතාව කුමක්ද?

ii. "එක් උන දාට දණ්ඩේ පැණි සේමා
වෙන් උන දාට යක් දෙබරේ වද සේමා"
(අ) මේ කවි අයත් වන ජන කවි ප්‍රවර්ගය කුමක් ද?
(ආ) එක් වීම, වෙන් වීම දක්වෙන උපමා දෙක පිළිවෙළින් දක්වන්න.

iii. "සියලු බෝග වස්තු ඉසුරු හරිති නෙක් දනෝ ...."
(අ) ඉහත කවි පාදය අයත් නාට්‍යයේ නාට්‍ය සම්ප්‍රදය කුමක් ද?
(ආ) ඉහත නාට්‍ය රචකයා විසින් රචිත ස්වයං ලිඛිත චරිතාපදනය නම් කරන්න.

iv. "මා දන්නේ මෙපමණක් ම ය. ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දන්නා සේක් වී නම් පසිඳු ව මැනව"
(අ) මෙහි නුඹ වහන්සේ යනු කවුද?
(ආ) මෙම පාඨය සඳහන් පාඩම කුමක්ද?

v. "දැන් හවස් වුණා වැඩියි. එහෙට වෙන දවසක යනවා"
(අ) මේ ප්‍රකාශය කළේ කවුද?
(ආ) මේ ප්‍රකාශය ඇතුළත් කථාවේ රචකයා නම් කරන්න.

vi. පහත කෘතිවල රචකයින් නම් කරන්න.
(අ) ළමා කවි කලඹ (ආ) එකෝමත් එක රටක

vii. "ඉලන්දාරියෙක් නැත්නම් නාකියෙක් වුණත් මොකක්ද ඇති වැරැද්ද?"
(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය අනුවර්තනය කළේ කවුද?
(ආ) ඉහත ප්‍රකාශය කරන්නේ කවුද?

viii. (අ) කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍ය දෙකක් නම් කරන්න.
(ආ) "දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට" මෙහි කියවෙන වෙහෙර කුමන නමකින් හැඳින්වේද?

ix. "තමන් පානා කෙළි තමන්ට ම දක්නා පමණ මුත් රැස් වුවන් නො බලන නියාව දැන මුසුප්පුව ගොසින්"
(අ) මෙහි "තමන්" යනුවෙන් හැඳින්වූ අයගේ නම කුමක්ද?
(ආ) රැස් වූ පිරිස බලා සිටියේ කවුරුන් දෙස ද?

x. පහත අන්වර්ථ නාමවලින් හඳුන්වන අය නම් කරන්න.
(අ) ෂඩ්භාෂා පරමේශ්වර (ආ) සිංහල ෂෙලී

(ලකුණු 10x2=20)

02) පහත දී ඇති ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i.

පටන් **<u>සුරිඳු</u>** දුන් උපදෙස් සිහි කොට
**<u>ඉටන් බෙලෙන්</u>** දැමුවෙන් ගුළි අහසට
තුටන් වඩන සුර අඟනෝ බැස සිට
පටන් ගත්තු නව සියයක් නැටුමට

(අ) ගුළි අහසට දැමූ විට සිදු වූ අසිරිමත් සිදුවීම කුමකට ද?
(ආ) සුරිඳු හා ඉටන් බෙලෙන් යන පදවලට අරුත් සපයන්න.

ii. "රජ්ජුරුවන් වනාහි රාජ මානයෙන් ද ඉසුරු මදයෙන් ද මත් වූ දණ්ඩකින් පහරන ලද සර්ප රාජයකු සේ කෝපයෙන් දිලිහී ....."
(අ) රජතුමා මෙසේ කෝප ගැන්වීමට තුඩු දුන් ආසන්නතම සිදුවීම කුමක්ද?
(ආ) අනතුරුව රජු ගන්නා ලද පියවර කුමක්ද?

iii.

මිහ'ඹ මුව මඬල මෙන් දිලෙන හැම විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට
**කිරඹ පොකුරු මී** රස ලැබ බොන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට

(අ) මෙහි මහී කාන්තාවගේ මුව මඬලට සමාන කොට ඇත්තේ කුමකට ද?
(ආ) **කිරඹ**, **පොකුරු මී** යන වචනවලට අරුත් සපයන්න.

iv. "මා ගිය කලැ ඔහුට සෙත් වෙයි. ගම් නැති තැනැ **මහ වල්හි** සිටියෙ **සිවු පදගයක්** අසා මා කෙරෙහි පැවිජි වැ රාත් වෙයි. ඉදින් නො ගියෙම් නම් මව මරා සසරින් නො නැඟිය හැකි වෙයි"
(අ) ගිය කල ඇති වන යහපත ද නොගිය කල වන අයහපත ද පිළිවෙළින් දක්වන්න.
(ආ) **මහවල්හි**, **සිවු පදගයක්** යන පදවල අරුත් දක්වන්න.

v.

මා කී දේ දෙවියනි බොරුවක් ම නැතී
බිම එළි වුණොත් කණු මදු බොහොම ළඟ ඇතී
ඇහැට වෙහෙස ඇත තුන් යමටම නිදි නැතී
ගොබ කළු වෙමින් කුරහන් කිරි වැද පැසෙති

(අ) කුරහන් රැක බලා ගැනීමේ දී ගොවියාට විඳීමට සිදුවන දුෂ්කරතාව කුමක්ද?
(ආ) ගොවියාට සුභදායක කරුණ කුමක්ද?

(ලකුණු 4x5=20)

03) උම්මග්ග ජාතකයෙහි එන මහෞෂධ පඬිවරයා
i. අභියෝගවලට අභියෝග කරන
ii. දුර දක්නා නුවණින් කටයුතු කරන චරිතයකි. එක් කොටසකට උදාහරණ දෙක බැගින් ගෙන මෙම කියමන සනාථ කරන්න.

**නැතහොත්**

හේන් ගොවියාගේ ජීවන ගැටලු ප්‍රකාශ කිරීමට ජනකවියා යොදා ගත්
i. අව්‍යාජ හැඟීම් ප්‍රකාශනයත්
ii. ධ්වනිතාර්ථවත් යෙදුම් භාවිතයත් පද්‍ය පන්තිය සාර්ථක වීමට හේතු වී ඇති බව "කුරහන් ඉසිමුව කළුවර බලාලා" පද්‍ය පන්තිය ඇසුරින් එක් කරුණකට උදාහරණය දෙක බැගින් ගෙන උක්ත කියමන පැහැදිලි කරන්න.

(ලකුණු 15)

04) විවිධ අවස්ථා වර්ණනයට උචිත වූ

i. අර්ථාලංකාර හා

ii. ශබ්දාලංකාර භාවිතයට සැළලිහිණි කතුවරයා දැක්වූ සමත්කම අදාළ පද්‍ය පන්තියෙන් උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

**නැතහොත්**

සිංහබාහු නාට්‍යයේ දී හමුවන

i. සිංහයාගේ චරිතයෙන් අඹු දරුවන් හට ඇලුම්කරන ස්වාමියෙකුගේ චරිතයත්

ii. සුප්පා දේවියගේ චරිතයෙන් පති භක්තියෙන් යුතු බිරිඳකගේ චරිතයත් මැනවින් නිරූපණය වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 15)

05) උතුම් මිනිස් පරපුරක් බිහි කිරීමේ උදාර චේතනාවෙන් ලියවුණු පද්‍ය පංතියක් ලෙස "මුනි සිරිපා සිඹිමින්නේ" පැදි පෙළ අගය කළ හැකිය. උදාහරණ තුනක් ඇසුරින් මෙම කියමන සනාථ කරන්න.

(ලකුණු 10)

06) සුමධුර වීණා නාදයට අනුව මනහර රංගනයක යෙදෙන දෙව්ලියන්ගේ රැඟුම පාඨකයා ඉදිරියේ ජීවමාන කිරීමට වැත්තෑවේ හිමි දැක්වූ සමත්කම නිදසුන් සහිතව විමසන්න.

(ලකුණු 10)

07) "ගුරුළුගෝමීන් සිත් ගන්නා ලෙස අවස්ථා හා සිද්ධි නිරූපණයෙහි සමතෙකි." අඟුල්මල් දමනය පාඩම ඇසුරෙන් උදාහරණ තුනක් දක්වමින් විමසන්න.

(ලකුණු 10)